**පාර්ලිමේන්තු ප්‍රකාශන මාලාවේ අංකය: 487**
**ආයතනයේ නම: ආරක්ෂක අමාත්‍යාංශය**
පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

**பாராளுமன்றத்தின் வெளியீட்டுத் தொடர் இலக்கம்: 487**
**நிறுவனத்தின் பெயர்: பாதுகாப்பு அமைச்சு**
பாராளுமன்றத்தின் அரச கணக்கு குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்பட்டு நடவடிக்கைகளும் பாராளுமன்றத்தில் சமர்ப்பித்தல்.

**Parliamentary Series No: 487**
**Name of the Institution: Ministry of Defence**
Submission of Observations of Hon. Minister and Steps Taken with Regard to the Reports Tabled by the Committee on Public Accounts in Terms of Standing Order No:119(4)

# පටුන/பக்கம்/Contents


| භාෂාව/மொழி/Language | පිටු අංකය/பக்க இலக்கம்/ Page Number |
|---|---|
| සිංහල/சிங்களம்/Sinhala | 1 - 28 |
| දෙමළ/தமிழ்/Tamil | 29 - 59 |
| ඉංග්‍රීසි/ஆங்கிலம்/English | 60 - 89 |

**<u>රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා 487 මගින් පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු ආරක්ෂක අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.</u>**

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන්දීමේ නිලධාරී / ගණන් දීමේ නිලධාරීගේ කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ. | නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනය ගත් ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| 01 | **<u>2018 අගෝස්තු මස 10 වැනි දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ලබා දී ඇත නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය.</u>**<br>1996 අංක 22 දරන ගිනි අවි (සංශෝධන) පනත හා පුපුරණ ද්‍රව්‍ය (සංශෝධිත) පනතේ විධිවිධාන සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය. | අදාළ සංශෝධනය කිරීමේ කාලය වසර 10 ක් ඉක්මවීමෙන් බලපත්‍ර ගාස්තු කාලීනව සංශෝධනය නොවීම මත සැලකිය යුතු ආදායමක් රජයට අහිමි වීම පිළිබඳව කාරක සභාව අවධානය යොමු කලේය.<br><br>2016 වර්ෂයේදී ගිනි අවි පනත සංශෝධනයට අදාළව කමිටුවක් පත් කරන ලද බවත් ඒ අනුව, 2021 දී අමාත්‍ය මණ්ඩල අනුමැතියට යොමුකල පනත් කෙටුම්පත නීතිපතිවරයා වෙත යැවීමට නියමිත බවද ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරී ප්‍රකාශ කලේය. ගිනි අවි බලපත්‍ර ගාස්තු සංශෝධනය කිරීම සඳහා අයවැය යෝජනා ලබාදුන් බවද එම ගාස්තු සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය පවතින බවද ප්‍රකාශ කලේය.<br><br><u>නිර්දේශ</u><br>1996 අංක 22 දරන ගිනි අවි (සංශෝධන) පනත හා පුපුරණ ද්‍රව්‍ය (සංශෝධන) පනත යන පනත් සංශෝධනය කිරීම සඳහා | **1996 අංක 22 දරන ගිනිඅවි (සංශෝධන) පනත මගින් සංශෝධිත 1916 අංක 33 දරන ගිනිඅවි පනත සංශෝධනය.**<br><br>අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක අමප/25/0524/803 /017 හා 2025 අප්‍රේල් මස 08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් නව ගිනිඅවි පනත සඳහා වායු තුවක්කු නියාමනයට අදාළ ප්‍රතිපාදන ඇතුලත් කිරීමට අනුමැතිය ලබා දී ඇත.<br><br>ඒ අනුව එම කරුණද ඇතුලත් කරමින් කෙටුම්පත් කරන ලද ගිනිඅවි පනත, නිර්දේශ ලබා ගැනීම සඳහා ගිනිඅවි කමිටුව වෙත 2026.04.24 දින යොමුකර ඇත.<br><br>පුපුරණ ද්‍රව්‍ය පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක වෙත 2026.04.10 දින යොමුකර ඇත. |

| | | | |
|---|---|---|---|
| | | පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම දක්වා වූ දින වකවානු සහිත වාර්තාවක් 2023.12.28 දිනට පෙර කාරක සභාව වෙත ලබාදෙන ලෙස ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිර්දේශ කලේය.<br><br>මේ පිළිබඳ වර්තමාන තත්ත්වය සඳහන් කර ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාර්ලිමේන්තු කටයුතු හා ප්‍රතිපත්ති) ගේ අංක MOD/PA/PAC/05/COPA/2023 හා 2023.12.28 දිනැතිව ලිපියක් එවා ඇත. අදාළ පනත් කෙටුම්පත් මේ වන විට පාර්ලිමේන්තුවේ පනතක් ලෙස සම්මත වී ඇත.<br><br>පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර ගාස්තු රෙගුලාසි (Regulations) මඟින් පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර ගාස්තු 2022 වර්ෂයේදී 60%කින් පමණ ඉහල දමා ඇති බවද, පුපුරණ ද්‍රව්‍ය පනත හා රසායනික ද්‍රව්‍ය පනත අනුව නාවික සැතපුම් 12 ක සීමාව ඇතුලත ලංකාව හරහා යන අන්තරායකර භාණ්ඩ ප්‍රවාහන නෞකා සඳහාද ආරක්ෂක අමාත්‍යාංශයට ගාස්තුවක් ගෙවා අනුමැතිය ලබාගත යුතු බව ප්‍ර.ග.නි ප්‍රකාශ කලේය.<br>තවද, ශ්‍රී ලංකා මුහුදේදී අනතුරට පත් වූ "එක්ස්ප්‍රස් පර්ල් නෞකාව" ඉහත පරිදි | |

| | | | |
|---|---|---|---|
| | | ආරක්ෂක අමාත්‍යාංශ අධීක්ෂණයට ලක් නොවීම කාරක සභාවේ විමසුමට ලක් වූ අතර, අන්තර් ජාතික සම්මුතීන්ට අනුව ශ්‍රී ලංකා මුහුදු සීමාවේ ගමන් කරන නෞකා වලින් අදාළ ගාස්තු අයකර ගැනීම සිදුවිය යුතු බවද ඒ සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ ද මැදිහත් වීමක් සිදුවිය යුතු බවද කාරක සභාව පෙන්වා දුන්නේය. මේ සඳහා අදාළ පනත් කෙටුම්පත් අවධියේ පවතින බවද, එමඟින් ශ්‍රී ලංකා නාවික හමුදාවට අදාළ ගාස්තු අය කිරීම සඳහා බලය ලබාදෙන බව ද ප්‍ර.ග.නි. ප්‍රකාශ කලේය.<br><br><u>නිර්දේශ</u><br>ශ්‍රී ලංකා මුහුදු සීමාවේ ගමන් කරන නෞකා වලින් අදාළ ගාස්තු අයකර ගැනීම සම්බන්ධයෙන් යෝජිත පනත් කෙටුම්පත් වර්තමාන තත්ත්වය පිළිබඳ වාර්තාවක් 2023.12.01 දිනට පෙර කාරක සභාව වෙත ලබාදෙන ලෙස අධිකරණ, බන්ධනාගාර කටයුතු ව්‍යවස්ථා ප්‍රතිශංස්කරණ අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි වෙත කාරක සභාව නිර්දේශ කලේය.<br>අදාළ පනත් කෙටුම්පත මේ වන විට පාර්ලිමේන්තුවේ පනතක් ලෙස සම්මත වී ඇත. | |

| | | | |
|---|---|---|---|
| 02 | **2018 අගෝස්තු මස 10 වැනි දින පැවති රජයේ ගිණුම් කාරක සභාව විසින් ලබා දී ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය.**<br><br>ත්‍රිවිධ හමුදාව හා පොලීසිය විසින් බාහිර පාර්ශවයන් සඳහා සපයන සේවාවන් මඟින් උපයන ආදායම්.<br><br>ත්‍රිවිධ හමුදා සම්බන්ධයෙන් වන සුබසාධක සංගම්වල වියදම්, ඒකාබද්ධ අරමුදලෙන් දරන බැවින්, එහි ආදායම් ද ඒකාබද්ධ අරමුදලට බැර විය යුතු බවත්, එහෙත් ඇතම් සුබසාධක සංගම් වල | ත්‍රිවිධ හමුදාවේ අරමුදල් වල ආදායම් බැර කිරීම පිළිබඳව 2023 නොවැම්බර් මස චක්‍රලේඛයක් නිකුත් කර ඇති බව මෙහිදී අනාවරණය විය. 2023.11.03 දිනැති අභ්‍යන්තර ලිපියෙන් එම ආදායම් වලින් ඒකාබද්ධ අරමුදලට බැරකල යුතු ආදායම් ප්‍රතිශත ත්‍රිවිධ හමුදා ප්‍රධානින්ට දැනුම් දී තිබිණි. අභ්‍යන්තර චක්‍රලේඛ මඟින් ආදායම් බෙදාහැරීමේ ප්‍රතිශත තීරණය කලද ඒ සඳහා මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගෙන නොතිබුණ බව මෙහිදී අනාවරණය විය. ප්‍රතිශත තීරණය කිරීමේ අධිකාරී බලය පැහැදිලි නොවන අතර, අදාළ ප්‍රතිශත වෙන් වන්නේ පිරිවැටුමෙන්ද ශුද්ධ ලාභයෙන්ද යන්න අපහැදිලි බව කාරක සභාව නිරීක්ෂණය කලේය. තවද, විගණනයට තොරතුරු ලබා දීමේදී සියලුම ආදායම් ප්‍රභවයන් ඉදිරිපත් කර නොතිබීම, වියදම් දරන්නේ ආදායමින්ද ඒකාබද්ධ අරමුදලින්ද යන්න සනාථ නොවීම, රඳවා ගන්නා මුදල් උපයෝජනය කරන ආකාර, වියදම් අනාවරණය නොවීම හා ආදායම් වියදම් සඳහා රජයේ මානව හා භෞතික සම්පත් යොදා ගැනුන ද එය රාජ්‍ය | ත්‍රිවිධ හමුදාවන් හා වෙනත් ආයතන වෙතින් බාහිර පාර්ශවයන් වෙත සපයන සේවාවන් වෙනුවෙන් උපයන ආදායම් වලින් ඒකාබද්ධ අරමුදලට බැර කල යුතු ආදායම් ප්‍රතිශත පිළිබඳව MOD/DEF/HRM/GEN/OTHERS/88(11) (197) හා 2023.11.03 දිනැති ලිපිය මඟින් ත්‍රිවිධ හමුදාව දැනුවත් කරන ලදී. **(ඇමුණුම - 01)** කෙසේ වුවද ඇමුණුම 01 හි සඳහන් ලිපියෙන් සඳහන් කරන ලද ආදායම් බෙදා හැරීමේ ප්‍රතිශත තීරණය කිරීමේදී මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගන්නා ලෙස රාජ්‍ය ගිණුම් කාරක සභාව 2023.11.28 දිනැති ලිපියෙන් උපදෙස් ලබා දී ඇත.<br><br>ඒ අනුව ත්‍රිවිධ හමුදාව විසින් සපයන ලද ආදායම් පිළිබඳ තොරතුරු අධ්‍යයනයෙන් හා ත්‍රිවිධ හමුදාවන්, ආරක්ෂක අමාත්‍යාංශයේ හා මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන් සමඟ පවත්වන ලද සාකච්ඡා වලින් පසුව මෙම සේවා වලින් ලබන ශුද්ධ ආදායමෙන් ඒකාබද්ධ අරමුදලට බැර කල යුතු ප්‍රතිශත භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය මත සංශෝධනය කරන ලද බව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ PFD/RED/REG/F&C/2025/DEF හා 2025.03.05 දිනැති ලිපිය මඟින් මෙම අමාත්‍යාංශය වෙත දන්වා ඇති අතර, **(ඇමුණුම - 02)** ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරන ලෙස මාගේ අංක MOD/F/DEF/HRM/GEN/OTHERS/88(11(VOL-2) හා 2025.03.31 දිනැති ලිපිය මඟින් ත්‍රිවිධ හමුදාව වෙත දන්වා යවා ඇත. **(ඇමුණුම - 03)**<br><br>පාර්ලිමේන්තුවේ ගිණුම් පිළිබඳව කාරක සභා රැස්වීමේදී ලබාදුන් නියෝග වලට අනුව ත්‍රිවිධ හමුදාව විසින් බාහිර පාර්ශවයන් සඳහා සපයන ලද සේවාවන් මඟින් උපයන ආදායම් සම්බන්ධයෙන් ත්‍රිවිධ හමුදාවේ කවර ආකාරයක හෝ ආරක්ෂක ගිණුම් හැරෙන්නට විවෘත කර ඇති බැංකු |

| | | | |
|---|---|---|---|
| | ආදායම් 100% ක් ම වෙනත් අරමුදල් වලට බැර කරන බවත් විගණකාධිපති විසින් පෙන්වා දෙනු ලැබිණි. ඉහත සේවා සැපයීමෙන් උපයන ආදායම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 ව්‍යවස්ථාව ප්‍රකාරව ඒකාබද්ධ අරමුදලට බැර කරන ලෙස ආරක්ෂක ලේකම් විසින් 2024 වර්ෂයේදී ත්‍රිවිධ හමුදා ප්‍රධානීන්ට දැනුම් දී මේ සම්බන්ධව නිසි ක්‍රමවේදයක් සකසා අමාත්‍යාංශයට වාර්තා කරන ලෙස දැනුම් දුන්න ද ඒ අනුව කටයුතු සිදු වී නොතිබිණි. | විගණනයට ලක් නොවීම ආදී කරුණු කාරක සභාව විසින් වැඩි දුරටත් නිරීක්ෂණය කරන ලදී.<br>ත්‍රිවිධ හමුදාවන් සතු සුභ සාධක අරමුදල් පිළිබඳව ආරක්ෂක අමාත්‍යාංශය මඟින් අධීක්ෂණය කල යුතු බවද, ත්‍රිවිධ හමුදා විගණන කමිටුවේ නිරීක්ෂණ මට්ටමින් සහභාගී වන අමාත්‍යාංශ අභ්‍යන්තර විගණකවරයා රජයේ ගිණුම් පිළිබද කාරක සභාවේ ඉහත අවධානයට ලක් වූ ත්‍රිවිධ හමුදා වල අරමුදල් බැර කිරීම් හා එම අරමුදල් ආශ්‍රිත අනෙකුත් කරුණු පිළිබඳව විගණන කමිටුවල සඳහන් කල යුතු බවද කාරක සභාව අවධාරණය කලේය. තවද, මෙලෙස උපයන ආදායම් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට නිසි ක්‍රමවේදයක් සකස් කල යුතු බවද කාරක සභාව ප්‍ර.ග.නි වෙත නිර්දේශ කලේය.<br><br><u>නිර්දේශ</u><br>කඳවුරු මට්ටමින් පවත්වාගෙන යන අරමුදල් සම්බන්ධව වාර්තාවක් හා ත්‍රිවිධ හමුදාවේ කවර ආකාරයක හෝ ආරක්ෂක ගිණුම් හැරෙන්නට විවෘත කර ඇති වෙනත් බැංකු ගිණුම් වලට අදාළව එම බැංකු ශාඛාව. ගිණුමේ නම, විවෘත කල දිනය. | ගිණුම් පිළිබඳව තොරතුරු වාර්තාවන් මෙම අමාත්‍යාංශයේ MOD/DEF/HRM/GEN/OTHERS/88/(11) හා 2024.01.10 දිනැති ලිපියෙන් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත යවා ඇත. **(ඇමුණුම - 04)** |

| | | | |
|---|---|---|---|
| | | ස්ථාවර/ඉතිරි කිරීම්/ ජංගම ගිණුමක්ද යන වග, කුමක් උදෙසා විවෘත කලේද, අත්සන් කිරීමේ අයිතිය තියෙන්නේ කාටද හා එම ගිණුම වල වර්තමාන ශේෂයන් යන තොරතුරු ඇතුලත් වාර්තාවක් 2024.01.10 දිනට පෙර කාරක සභාව වෙත ලබාදෙන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි වෙත නිර්දේශ කලේය.<br>ආරක්ෂක ලේකම්ගේ අංක MOD/DEF/HR/GEN/OTHERS/88(11) හා 2024.01.10 දිනැති ලිපිය. | |
| 03 | **<u>2018 අගෝස්තු මස 10 වැනි දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ලබා දී ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය.</u>**<br><br>ත්‍රිවිධ හමුදාවන් සඳහා ආහාර ද්‍රව්‍ය ප්‍රසම්පාදනය. | මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලියට සම්බන්ධ සියලුම ආයතන සම්බන්ධ කරමින් තොරතුරු කළමනාරණ පද්ධතියක් සැකසීමට කාරක සභාව නිර්දේශ කල අතර, සපයනු ලබන ආහාර පිළිබඳව හමුදාවන්ගේ ප්‍රතිචාර ඇගයීමේ දත්ත පද්ධතියක්ද පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය ද පෙන්වා දෙන ලදී. කෙසේ වුවද, මුළු සැපයුම් වටිනාකමින් 70% ක් ලබා ගන්නා යුද්ධ හමුදාව මෙවැනි පද්ධතියක් භාවිතා නොකිරීමද, වාර්ෂිකව රු.බිලියන 96 ක් පමණ වැය කරමින් හමුදා කඳවුරු 30 කට අධික සංඛ්‍යාවකට ආහාර අයිතම 600ක් පමණ සැපයීමට කොන්ත්‍රාත්කරුවන් 25 ක් තෝරා ගැනීම, | 01. ලබා දී ඇති උපදෙස් ප්‍රකාරව පරිගණක මෘදුකාංග පද්ධතියක් සැපයීම් හා ප්‍රවාහන අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණය යටතේ තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් සකස් කරමින් පවතී.<br><br>02. තුලවාසී සලාක නිකුත් කිරීමේ ක්‍රියා පිළිවෙතට අනුව සලාක දත්ත කළමනාකරණ පද්ධතිය නියමු ව්‍යාපෘතියක් වශයෙන් යුද්ධ හමුදා සැපයුම් හා පාරිභෝගික ඒකක තුල පහත සඳහන් ක්‍රියාකාරකම් වෙනුවෙන් ක්‍රියාත්මක කරනු ලබයි.<br><br>(අ) සැපයුම්කරුවන් වෙතින් නැවුම්/වියළි සලාක ඉල්ලුම් කිරීම.<br><br>(ආ) පාරිභෝගික ඒකක/ ආයතන වෙතින් නැවුම්/වියළි සලාක ඉල්ලුම් කිරීම. |

| | | | |
|---|---|---|---|
| | | කොන්ත්‍රාත්තුවේ ඇස්තමේන්තු වටිනාකම ගණනය අතාත්වික වීම, මිල ගණන් කැඳවීමේදී ලබාදෙන අවම මිල තාත්ත්වික නොවීම හා අවම මිල හා වෙළඳපොළ මිල අතර විචලනය ඇතැම් අයිතම් වල 500% - 1000% ක් පමණ වීම ආදී කරුණු කාරක සභාව හමුවේ අනාවරණය විය.<br><br>ඉහත කරුණු පිළිබඳව කාරක සභාවේ දැඩි අවධානය යොමු වූ අතර, සැපයුම්කරුවන් කුමන මිලක් ඉදිරිපත් කලද, එය වෙළඳපොලෙහි පවතින මිලට වඩා ඉක්මවිය නොහැකි බව ද යුද්ධ හමුදාවේ දත්ත පද්ධතියේ පළමු අදියර 2023.12.31 දිනට ක්‍රියාත්මක කරන බවද 2024 මාර්තු මස වනවිට එම දත්ත පද්ධතිය සම්පූර්ණ කිරීමටද කටයුතු කරන බව ද යුද්ධ හමුදාවේ මේ සම්බන්ධයෙන් ප්‍රමාදයක් පවතින බවද ප්‍ර.ග.නි ප්‍රකාශ කලේය.<br><br><u>නිර්දේශ</u><br>යුද්ධ හමුදාවේ දත්ත පද්ධතිය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කරන දින වකවානු සහිත වාර්තාවක් 2023.12.11 දිනට පෙර කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි. වෙත නිර්දේශ කලේය.<br><br>තවද, ආහාර ප්‍රසම්පාදන ඇස්තමේන්තු නිවැරදිව ගණනය කිරීම සඳහා ආරක්ෂක | (ඈ) ශ්‍රීලයුසේබ බලසන/ අංශ වෙතින් නැවුම්/වියළි සලාක නිකුත් කිරීම.<br><br>03. එමෙන්ම, පහත සඳහන් ක්‍රියාවලීන් මෙම පද්ධතිය තුල ක්‍රියාත්මක කිරීම සඳහා යුද්ධ හමුදා තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් ඉල්ලුම් කර ඇති අතර, එම සංවර්ධන කටයුතු සිදු කෙරෙමින් පවතී.<br><br>(අ) ශ්‍රීලයුසේබ බේකරි අංශයන් වෙතින් පාරිභෝගික ස්ථානයන් වෙත නිෂ්පාදනය කර ලබාදෙනු ලබන ආහාර ද්‍රව්‍ය වෙනුවෙන් ක්‍රියාත්මක වනු ලබන ක්‍රියාවලි දත්ත පද්ධතිය වෙත ඇතුලත් කිරීම.<br><br>(ආ) යුද්ධ හමුදා විගණන කණ්ඩායම් හා වෙනත් පරීක්ෂණ කටයුතු වෙනුවෙන් ඉදිරිපත් කිරීමට අදාළ තොරතුරු/ වාර්තා මෙම පද්ධතිය තුලින් පරීක්ෂා කිරීමට හැකිවන පරිදි සකස් කිරීම.<br><br>(ඇ) සෞඛ්‍යනිල සලාක වට්ටෝරුවට අමතරව ශ්‍රීලයුසේබ ක්‍රියාපිළිවෙත යටතේ ක්‍රියාත්මක කරනු ලබන රෝහල් සලාක, කැලෑ සලාක මලු, සත්ව සලාක හා පෝෂණ අතිරේකය වැනි විවිධ අවස්ථාවන් වෙනුවෙන් සලාක පහසුකම් ලබාදෙනු ලබන අතර, ඒ වෙනුවෙන් මෙම දත්ත පද්ධතිය සකස් කිරීම.<br><br>04. එබැවින්, යුද්ධ හමුදා සැපයුම් ඒකක සහ පාරිභෝගික ඒකක වෙතින් අනුමත සලාක වට්ටෝරුවට අනුව මේවන විට ක්‍රියාත්මක පද්ධතිය පරිශීලනය කිරීමේදී ඇතිවන ගැටලු පිළිබඳව තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබන අතර, අදාළ ගැටලු එම අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ සම්බන්ධතාවයෙන් යුතුව නිරාකරණය කර ගනිමින් අන්තර්ජාල පහසුකම් සහිත පරිගණක පහසුකම් පවතින ස්ථානයන් |

| | | | |
|---|---|---|---|
| | | අමාත්‍යාංශයෙන් ත්‍රිවිධ හමුදාව වෙත නියෝග ලබාදුන් බවද ප්‍ර.ග.නි. ප්‍රකාශ කලේය. චක්‍රලේඛයක් නිකුත් කිරීම මගින් මෙම නියෝගය විධිමත්ව ලබාදෙන ලෙස කාරක සභාව විසින් උපදෙස් ලබාදෙන ලදී.<br><br>ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාර්ලිමේන්තු කටයුතු හා ප්‍රතිපත්ති) ගේ අංක MOD/PAC/05/COPA/2023 හා 202312.14 දිනැති ලිපිය මගින් මෙම මෘදුකාංග පද්ධතිය 2024 මැයි මස වන විට අවසන් කිරීමට හැකි බව හා ඒ සම්බන්ධ කාල රාමුව ඉදිරිපත් කර ඇත. | වෙතින් පමණක් ක්‍රියාත්මක කරනු ලබයි.<br><br>05. තවද, යුද්ධ හමුදාව තුල නැවුම්/වියළි සලාක මිල දී ගැනීම්/නිකුත් කිරීම් අදාළ පද්ධතිය මගින් සිදුකර ගෙන යන නමුත්, සලාක කළමනාකරණ පද්ධතිය සාර්ථකව ක්‍රියාත්මක කර පවත්වාගෙන යාම වෙනුවෙන් අවශ්‍යාව පවතින පරිගණක යන්ත්‍ර 110ක ප්‍රමාණය මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු 2025 වර්ෂයේදී සිදුකරන ලද අතර, සැපයුම්කරු විසින් එම පරිගණක යන්ත්‍ර ප්‍රමාණය සැපයුම් කිරීමට නොහැකි බව දැනුම් දීම හේතුවෙන් අදාළ පරිගණක යන්ත්‍ර මිලදී ගැනීමට නොහැකි වී ඇති බව ප්‍රධාන සංඥා නිලධාරී කාර්යාලය වෙතින් දැනුම් දී ඇත. එසේම 2026 වර්ෂයේදී සන්නිවේදන හා තොරතුරු තාක්ෂණ උපකරණ මිලදී ගැනීමට අදාළ ප්‍රතිපාදන වෙන් කිරීමේ කටයුතු මේ වන විට සිදුකර ගෙන යන බවත්, එම ප්‍රතිපාදන මුදල් වෙන් කිරීමෙන් පසු අදාළ පරිගණක යන්ත්‍ර ප්‍රමාණය ලබා දීමට කටයුතු කරනු ලැබේ. |
| 04 | <u>**එක්සත් ජාතීන්ගේ සාම සාධක හෙහෙයුම් රාජකාරී**</u> | එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් රාජකාරී වෙනුවෙන් 2022 වර්ෂය තුල එක්සත් ජනපද ඩොලර් 19,177,125.83 ක් රැස්කර ඇතත්, එම වර්ෂයේ ආදායම ලෙස එක්සත් ජනපද ඩොලර් 7,506,868.47 ක් (රු.2,447,153,974) ක් පමණක් දක්වා තිබුණි. ඒ අනුව වර්ෂයේ ආදායමින් එක්සත් ජනපද ඩොලර් 11,670,207.36 ක ආදායමක් ගිණුම් තුලින් නිරූපණය නොවීම කාරක සභාවේ අවධානයට යොමු විය. 1/2015 රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛය අනුගමනය නොකිරීම හා ඉහත මුදල් ඒකාබද්ධ අරමුදලට බැර නොකිරීම පිළිබඳව කාරක සභාව ප්‍රශ්න කලේය. | සමාලෝචිත වර්ෂය තුල ආදායම් සංකේතාංක 20.03.06.00 එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් රාජකාරි ඉටු කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව හා ගුවන් හමුදාව ඇ.ඩො 19,177,125.83 රැස් කර ඇතත්, ඒසීඒ - 1 ආදායම් ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂයේ ආදායම ලෙස දක්වා ඇත්තේ ඇ.ඩො 7,506,868.47 ක් හෙවත් රු.2,447,153,974 ක වටිනාකමකි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ආදායම ඇ.ඩො 11,670,270.36 ක ආදායමක් (රු.4,205,942,732.54) ගිණුම් තුලින් නිරූපනය නොවුණ බව විගණන නිරීක්ෂණයට ලක්විය.<br><br>මෙලෙස ඇ.ඩො 11,670,207.36ක වෙනසට හේතූන් ලෙස පහත කරුණු පෙන්වා දිය හැක.<br><br>2022 ගුවන් හමුදාවට අයත් ආදායමක් වන ඇ.ඩො 5,018,232.97 ක |

| | | | |
|---|---|---|---|
| | | රඳවාගත් මුදල් විදේශ විනිමය අර්බුදය හේතුවෙන් භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන රඳවාගෙන ඇති බව ප්‍ර.ග.නි. ප්‍රකාශ කලේය. මුදල් රඳවා තබා ගැනීමට හේතුව තවදුරටත් සාම සාධක හමුදා යැවීමටත් විදේශයන්හි රාජකාරී සඳහා යොදවා ඇති හෙලිකොප්ටර් යානා ආදිය අලුත්වැඩියාව සඳහා බවත් ප්‍ර.ග.නි ප්‍රකාශ කලේය. මෙම මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කරන ලෙස වසර අවසානයේ අදාළ ගිණුම් හිමි බැංකු වලට දැන්වූ වද 2022 වර්ෂයේ එහි යම් ප්‍රමාදයක් සිදු වී ඇති බවද 2023.01.03 දින එම මුදල ඒකාබද්ධ අරමුදලට බැර කර ඇති බවද ප්‍ර.ග.නි ප්‍රකාශ කලේය. | මුදල (රු.1,822,170,573.74) 2023.01.03 භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ නමින් පවත්වාගෙන යනු ලබන ගිණුමට ප්‍රේෂණය කර ඇත. **(ඇමුණුම - 05)**<br><br>තවද. 2022 වර්ෂයේ ඒකාබද්ධ අරමුදලට බැර නොකරන ලෙස ඇ.ඩො.3,039,169.61 ක මුදලක් (රු.1,103,552,877.09) 2023.01.03 දින ඒකාබද්ධ අරමුදල වෙත බැර කර ඇත. **(ඇමුණුම - 06)**<br><br>එමෙන්ම 2022.08.19 දින සාම සාධක මෙහෙයුම් රාජකාරී සඳහා උපයන ලද ආදායමෙන් ණයවර ලිපි විවෘත කර ගැනීම සඳහා ඇ.ඩො.3,612,804.78 ක වටිනාකමක් යුද්ධ හමුදාව විසින් ගිණුමෙහි රඳවා තබාගෙන ඇත. **(ඇමුණුම - 07)** |
| 05 | <u>අනාර්ථික හා අරපිරිමැසුම් රහිත ගනුදෙනු</u><br>ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය | 2022 ජනවාරි 13 දින පවත්වා තිබූ එක් දින සම්මන්ත්‍රණයකට පුද්ගලයන් 400 ක් වෙනුවෙන් රු.5,197,413 ක් අනාර්ථිකව වැයකර තිබීම සහ චක්‍රලේඛ අනුව, රාජ්‍ය වියදම් පාලනය කල යුතු වුවද මෙහිදී, වැය විෂයක් යටතේ වියදම් නොකර සුහසාධන අරමුදලින් වියදම් කර පසුව එම වැය විෂයය සඳහා ප්‍රතිපූර්ණය කිරීමේ සාවද්‍ය ක්‍රමයක් අනුගමනය කර තිබීම කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලදී. කොවිඩ් වසංගතය හේතුවෙන් 2019 වර්ෂයේදී පවත්වන්නට නියමිත තිබූ මෙම සම්මන්ත්‍රණය 2022 වර්ෂයේදී පවත්වන්නට යෙදුන බවත් නිලධාරීන් 300 කට සැලසුම් කරන ලද | ශීර්ෂගත වැඩසටහන ත්‍රිවිධ හමුදා නිලධාරීන් 300 කගේ සහභාගිත්වයෙන් බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්වීමට සැලසුම් කරන ලදි. ඒ අනුව මෙම වැඩසටහන සැලසුම් කළ 2021.12.15 දින නියමිත පරිදි පැවැත්වීමට මූලික පිරිවැයන් හා අනෙකුත් ක්‍රියාකාරකම් සිදු කරන ලදී. කෙසේ වෙතත් මෙම වැඩසටහන පැවැත්වීමට සැලසුම් කළ දින වන විට COVID Omicron වෛරස තත්ත්වය හේතුවෙන් වැඩසටහන නියමිත දින දී නොපවත්වා කල් දැමීමට සිදු විය.<br><br>2. ඉන් අනතුරුව මෙම වැඩ සටහන 2022.01.13 දින පවත්වන ලද අතර, මෙම වැඩසටහනේ ඇති වැදගත්කම හේතුවෙන් මූලිකව සැලසුම් කළ නිලධාරීන් 300 කගේ සහභාගිත්වය 400 ක් දක්වා වැඩි කරන ලදී. තවද, |

| | | | |
|---|---|---|---|
| | | සම්මන්ත්‍රණය ත්‍රිවිධ හමුදා ඉල්ලීම මත පසුව නිලධාරීන් 400 කට වැඩි වූ බවද ප්‍ර.ග.නි. ප්‍රකාශ කලේය. | ඉහත දක්වා ඇති පරිදි වැඩසටහන පැවැත්වීමේදී අපේක්ෂිත නිලධාරී සහභාගිත්වය ඉහල යාම හේතුවෙන් ඇස්තමේන්තු ගත පිරිවැය ඉක්මවා වැය දැරීම් සිදුවූ අතර, ඒ සඳහා පහත සඳහන් කරුණු බලපා ඇත.<br><br>අ. වැඩසටහන පැවැත්වීම සඳහා සැලසුම්කල දිනට සියළුම කටයුතු සංවිධානය කර අනෙකුත් අවශ්‍යතාවයන් සූදානම් කර තිබියදී එදින වැඩසටහන නොපවත්වා 2022.01.13 දින වැඩසටහන පැවැත්වීමට සිදු වීම.<br><br>ආ. මූලිකව 2021 වර්ෂය තුල වැඩසටහන සැලසුම් කලත් 2022 වර්ෂය තුල වැඩසටහන පැවැත්වීමට සිදුවීම මඟින්, එම කාල සීමාවේ ඇතැම් අපේක්ෂිත වැය දැරීම් ඉහල යාම.<br><br>ඇ. මූලික සැලැසුම තුළ නිලධාරීන් 300 කට වැඩසටහන් සැලසුම් කර තිබුනත්, නිලධාරී 400 කට වැඩසටහන පැවැත්වීම තුලින් පිරිවැය ඉහලයාම් සිදු වී තිබීම.<br><br>3.මෙම වැඩසටහන පැවැත්වීම සඳහා එස් ඩබ්ලිව් ආර් ඩී බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව තෝරා ගැනීමේදි පිරිවැයට අමතරව පහත දක්වා ඇති කරුණු කෙරෙහි ද අවධානය යොමු කරන ලදී.<br><br>අ. මෙම පාඨමාලාව සඳහා ත්‍රිවිධ හමුදා නිලධාරීන් විශාල පිරිසක් සහභාගි වීම හේතුවෙන් ඔවුන් වෙත ලබාදෙන ආරක්ෂාව, සත්කාරය, ආහාර සහ සම්බන්ධීකරණ කටයුතු මනාව සිදු කල යුතු වීම.<br><br>ආ. කොවිඩ් 19 වෛරසයේ බලපෑම් තත්ත්වය මත නිලධාරීන් 400 ක ප්‍රමාණයකගේ පමණ සහභාගීත්වයෙන් වැඩසටහන පැවැත්වීමේ දී, ඊට අදාළ සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රම වේදයන් සහ අනෙකුත් පාලන ක්‍රම වේදයන් |

| | | | |
|---|---|---|---|
| | | | ගැන වඩාත් සැලකිල්ලක් දැක්විය යුතු වීම සහ ඒ සඳහා රාජ්‍ය අනුග්‍රහය මත ක්‍රියාත්මක වන එස් ඩබ්ලිව් ආර් ඩී බණ්ඩාර නායක අනුස් මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව වඩාත් සුදුසු වීම.<br><br>ඇ. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය එස් ඩබ්ලිව් ආර් ඩී බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රය තුල පිහිටා තිබීම හේතුවෙන් වැඩසටහන් සම්බන්ධීකරණය සහ අනෙකුත් පාලන කටයුතු පහසුවෙන් සිදු කළ හැකි වීම සහ ඒ මගින් වෙනත් දුරස්ථ ස්ථානයක වැඩසටහන පැවැත්වීමේ දී ඇතිවිය හැකි පරිපාලනමය ගැටළු සහ ඇති විය හැකි අමතර පිරිවැය අවම කරගත හැකි වීම.<br><br>4. තවද, මෙම වැඩසටහනට අදාළව ආහාර අවශ්‍යතාවය M/s Mount Lavinia Catering Service ආයතනය වෙතින් ලබාගත් අතර, ඒ සඳහා හේතු වන ලද්දේ, ඩබ්ලිව් ඩී ආර් ඩී බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ ආහාර සැපයීම් නිල සැපයුම්කරු M/s Mount Lavinia Catering Service ආයතනය වීම හේතුවෙන් සහ වෙනත් බාහිර සැපයුම් ආයතන වෙතින් ආහාර සපයා ගැනීම සඳහා නීත්‍යානුකූල හැකියාවක් නොමැති වීම.<br><br>5. විගණන නිරීක්ෂණයේ දක්වා ඇති පරිදි කාර්යය මණ්ඩල පුහුණුව වෙනුවෙන් පූර්ව දින රාත්‍රිය සඳහා ශාලා පහසුකම්, පෙර පුහුණුවීම් සඳහා සම්මන්ත්‍රණ ශාලා පහසුකම් වෙන්කර ගැනීම, මල් සැරසිලි, බැනර් මුද්‍රණය සහ සහභාගී වූ නිලධාරීන් හට හැඳුනුම්පත් සකස් කිරීම යන වියදම් අත්‍යවශ්‍යයෙන් දැරිය යුතු වීම.<br><br>6. මේ අනුව, මෙම වැඩසටහන වෙනුවෙන් ඉහත දක්වා ඇති කරුණු අනුව සමස්ත වශයෙන් රු.5,197,413.00 ක් වැය දැරීමට සිදු වූ බව |

| | | | |
|---|---|---|---|
| | | | පෙන්වා දෙමි. තවද, 2021.12.21 දිනැති අංක 03/2021 හා 2022.04.26 දිනැති අංක 03/2022 දරන අයවැය චක්‍රලේඛ මඟින් ලබා දී ඇති උපදෙස් කෙරෙහි අවධානය යොමුකර කටයුතු කරනු ලබන අතර, ඉදිරියේදී සිදු කරනු ලබන සෑම මූලා  ගනුදෙනුවකදීම එම උපදෙස් සහ මඟපෙන්වීම් අනුගමනය කිරීමට අදාළව සියලුම කාර්යය මණ්ඩල දැනුවත් කර ඒ අනුව කටයුතු සිදුකිරීමට උපදෙස් දී ඇත.<br><br>වර්තමානය වන විට අමාත්‍ය මණ්ඩල සංදේශ ප්‍රකාරව ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය වසා දමා ඇත. |
| 06 | <u>අනාර්ථික හා අරපිරිමැසුම් රහිත ගනුදෙනු</u><br>ජාතික ආරක්ෂක විද්‍යායතනය | පාඨමාලාවට සහභාගී වන නිලධාරීන් 31 ක් සඳහා නවාතැන් පහසුකම් ලබාදීම වෙනුවෙන් මාසික කුලිය රු.3,000,000 බැගින් ගෙවා වර්ෂ 02 ක කාලයක් සඳහා රු.72,000,000 ක බදු කුලී ගිවිසුමක් මත ගෘහ ඒකක 24 කින් යුත් නිවාස සංකීර්ණයක් ලබාගෙන තිබීම හා එම නිවාස සංකීර්ණයේ සිය ප්‍රවාහන පහසුකම් සැපයීම වෙනුවෙන් කුලී පදනම මත බස් රථයක් ද ලබා ගැනීම වෙනුවෙන් රු.1,750,500 ක් ගෙවා තිබීම පිළිබඳව කාරක සභාව විමසීය.<br><br>මෙම පාඨමාලාව පළමු අදියරේදී මෙම වියදම් දැරූ බවද , ත්‍රිවිධ හමුදාවේ හා සමාන්තර සිවිල් නිලයන් වල ඉහලම නිලධාරීන් මීට සහභාගී වන බවද ප්‍ර.ග.නි. | අදාළ ගොඩනැගිල්ල සඳහා බදු ගිවිසුම අවසන් වීම මත ගිවිසුම්ගත වර්ෂ දෙක අවසානයේ එම ගොඩනැගිල්ල එහි අයිතිකරු වෙත නැවත භාර දීමට කටයුතු කර ඇත. 2026 වර්ෂය ආරම්භයේ සිට නාගරික සංවර්ධන අධිකාරිය විසින් මිලදී ගෙන, ත්‍රිවිධ හමුදාව වෙත වෙන් කරන ලද ‘වියත්පුර’ නිවාස සංකීර්ණයේ නිවාස ඒකක 51න් 18ක් ජාතික ආරක්ෂක විද්‍යායතනයේ පූර්ණකාලීන පාඨමාලා හදාරනු ලබන නිලධාරින් වෙත වෙන් කොට අදාළ හමුදාවන් වෙතින් ලබාදීමට අවශ්‍ය කටයුතු සැලසුම් කරන ලදී. MOD/TEC/3/DHQC/UDA HOUSING UNIT/2025(48) හා 2025.09.17 දිනැති ලිපිය මඟින් දන්වා ඇති පරිදි 2025 සැප්තැම්බර් මස 03 වන දින පැවති මෙම අමාත්‍යාංශ ආයතන ප්‍රධානීන්ගේ රැස්වීමේදී, ප්‍රමුඛත්වය මත මෙම විද්‍යායතනය වෙත අදාළ නිවාස ප්‍රමාණයක් ලබාදෙන ලෙස ආරක්ෂක ලේකම් විසින් උපදෙස් ලබාදෙන ලදි. ඒ අනුව පිළිවෙලින් යුද්ධ හමුදාව වෙතින් නිවාස ඒකක 10ක් නාවික හමුදාව වෙතින් නිවාස ඒකක 4ක් හා ගුවන් හමුදාව වෙතින් නිවාස ඒකක 4ක් වශයෙන් නිවාස ඒකක 18ක් මෙම  විද්‍යායතනයේ ජ්‍යෙෂ්ඨ නිලධාරින් වෙත වෙන්කරන ලද අතර, පාඨමාලාවේ ප්‍රයෝජනය |

| | | | |
|---|---|---|---|
| | | ප්‍රකාශ කලේය. මෙහි තුන්වන අදියරේ සිට විදේශ නිලධාරීන්ද සහභාගී වන බවත් එමගින් රටට විදේශ විනිමය ලබාගත හැකි වන බවත් හෙතෙම ප්‍රකාශ කලේය. විශාල මුදලක් ගෙවා කුලී පදනම මත ගොඩනැගිල්ලක් ලබා ගැනීම වෙනුවට ඉදිරියේදී ජාතික ආරක්ෂක විද්‍යායතනය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීම සම්බන්ධයෙන් සලකා බලන ලෙස කාරක සභාව අවධාරණය කලේය. මේ සඳහා අවශ්‍ය මූල්‍යමය සහාය ලබාදීම පිළිබඳව සලකා බලන ලෙස මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය වෙත කාරක සභාව යෝජනා කලේය. | සඳහා මේ වන විට යුද්ධ හමුදාව සහ ගුවන් හමුදාවට අදාළ නිවාස ඒකක 14ක් එම නිලධාරින් වෙත ලබා දී පාඨමාලාව බාධාවකින් තොරව සිදුකරගෙන යන බව දන්වමි. ඉදිරියේදී නාවික හමුදාව වෙතින් ලැබීමට නියමිත නිවාස ඒකක 4ක ප්‍රමාණය කඩිනමින් ලබා ගැනීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරමින් පවතී. එමෙන්ම ගොඩනැගිලි කුලී ගෙවීම සඳහා 2026 වර්ෂයේ මෙම විද්‍යායතනය වෙත වෙන් කරන ලද ප්‍රතිපාදනයන්ගෙන් 'වියත්පුර' නිවාස සංකීර්ණය සඳහා අවශ්‍ය වන නිධන් අරමුදල (Sinking Fund) සඳහා ගෙවීම, කළමනාකරණ ගාස්තු (Management Fee), විදුලි බිල්පත්, ජල බිල්පත්, වරිපනම් සහ වෙනත් අත්‍යාවශ්‍ය වියදම් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන හැර ඉතිරි රුපියල් මිලියන 13ක ප්‍රමාණය නැවත ආරක්‍ෂක අමාත්‍යාංශය වෙත භාරදීමට ඉදිරි කටයුතු සිදුකරමින් පවතින අතර, මින් ඉදිරියේදී කුලී පදනම මත ගොඩනැගිලි ලබා ගැනීම සිදු නොවන බව කාරුණිකව දන්වමි. |
| 07 | <u>උපාය මාර්ගික සන්නිවේදන ජාල ව්‍යාපෘතිය</u> | 2016 වර්ෂයේ ඉදිකිරීම් අවසන් වීමට යෝජිත වුවද මෙම ව්‍යාපෘතියේ කාල සීමාව වසර 06 කින් දීර්ඝ කර තිබුණි. 2022 දෙසැම්බර් 31 දිනට සමස්ථ භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 73% හා 53% විය. මේ ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 658.68 ක් වැය කර තිබුණද එමගින් සන්නද්ධ සේවා අතර, අපේක්ෂිත ඒකාබද්ධ උපාය මාර්ගික සන්නිවේදනය පවත්වා ගැනීමේ මූලික අරමුණ කාලීනව ඉටුකරගත නොහැකිව තිබුණි. එසේම, 2016 වර්ෂයේ සන්නිවේදන | උපාය මාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාල ව්‍යාපෘතිය 2025 වර්ෂයේ ත්‍රිවිධ හමුදා ප්‍රධානින්ගේ තීරණ මත නවතා ඇති අතර, එම වර්ෂය අවසානයේ දිට්වා සුළි කුණාටු තත්ත්වයත් සමඟ සිවිල් සන්නිවේදන සමාගම්හි දුරකථන ජාල පද්ධති අකර්මන්‍ය වීම සැලකිල්ලට ගනිමින් ආරක්ෂක ලේකම් තුමන්ගේ උපදෙස් මත, මෙම ව්‍යාපෘතිය නැවත ජාතික උපායමාර්ගික සන්නිවේදන පද්ධතීන් වශයෙන් සියළුම රාජ්‍ය ආයතන සම්බන්ධ කර ජාතික උපායමාර්ගික සන්නිවේදන ජාල ව්‍යාපෘතිය නමින් ආරම්භ කිරීමට තීරණය කළ බැවින් ඒ සඳහා ඉදිරි කටයුතු සිදු කෙරෙමින් පවතී. මෙහිදී මෙම NSCN පද්ධතිය ආරම්භ කිරීමට අවශ්‍යතාවයන් හා එහි System Architecture සැකසීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය, ත්‍රිවිධ හමුදා / පොලිස් හා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙතින් මෙම |

| | | | |
|---|---|---|---|
| | | පද්ධතියේ ප්‍රසම්පාදන පිරිවිතර වර්තමාන සන්නිවේදන තාක්ෂණයට ගැලපේද යන්න ගැටලු සහගත අතර, සමස්ථ වියදම අනාර්ථිකමය වියදමක් බව කාරක සභාව නිරීක්ෂණය කලේය.<br><br>ව්‍යාපෘතිය තාවකාලිකව නතර කිරීමට මහා පරිමාණ ඉදිකිරීම් පිළිබඳ කටයුතු කරන විශේෂ ව්‍යාපෘති කමිටුව තීරණය කරන ලද බව හා මීට අදාළ කුළුණු ඉදිකිරීම් කොටසක් සිදුකර ඇති බවද වැයකර ඇති මුදලට සාපේක්ෂව දේපළ ප්‍රමාණයක් ඉතිරිව ඇති බැවින් එම දේපළ නඩත්තු කරමින් පවතින බවද තාක්ෂණය යාවත්කාලීන කර මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කමිටුවක් පත්කර ඇති බවද ප්‍ර.ග.නි ප්‍රකාශ කලේය. | විෂයන්හි සුදුසුකම් ලත් නිලධාරීන්ගෙන් සමන්විත මණ්ඩලයක් පත්කර ඇති අතර, එම වාර්තාව නිමකර නුදුරේදී ආරක්ෂක ලේකම්තුමාට දැනුම් දීමට නියමිතව ඇත.<br><br>වර්තමානය වන විට විදුලි සංදේශ නියාමන කොමිසන් සභාවේ දැනුම්දීම මත අදාළ කුළුණු පිළිබඳව විද්‍යුත් සංනිවේදන ආයතන කිහිපයක් සමඟින් සාකච්ඡා කල අතර, ඔවුන් විසින් ඉල්ලුම් කරනු ලැබූ මූලික තොරතුරු ලබාදී ඇත. මෙයට අමතරව ශ්‍රී ලංකාව තුල නුදුරේදී ස්ථාපිත කිරීමට නියමිත Digital Terrestrial රූපවාහිනී විකාශනය සඳහා පිදුරුතලාගල හා ගොන්ගල සංප්‍රේෂණ කුළුණු යොදා ගැනීම පිළිබඳව විශේෂඥ කණ්ඩායමක් විසින් අවශ්‍ය තාක්ෂණික ශක්‍යතා අධ්‍යන සිදුකර ඇති අතර, ඔවුන්ගේ අවශ්‍යතාවය සැපයීම පිළිබඳව සාකච්ඡා කර නුදුරේදී එම කුළුණු කුලී පදනම මත ලබාදීම සඳහා ගිවිසුම් ගතවීමට බලාපොරොත්තු වේ. |
| 08 | <u>ප්‍රසම්පාදනය</u> | (i) 2018 මාර්තු 16 දින මෝටර් රථ 08 ක් සහ කැබ් රථ 02 ක් මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ ලබා ගැනීම සඳහා ලැබී තිබුණු එකම ලංසුව මත පදනම්ව සැපයුම්කරු තෝරාගෙන තිබුණි. ඒ අනුව, ඉදිරි වර්ෂ 05 ක් වෙනුවෙන් සිදුකල රු.98,300,940 ක් වූ මෙම ගනුදෙනුව සඳහා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව අපේක්ෂිත තරඟකාරී මිල ගණන් තබා | මෙම නිරීක්ෂන සම්බන්ධයෙන් වන වර්තමාන ප්‍රගතිය පහත දක්වා ඇත.<br><br>3.1 ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම්, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරුන් හා ඒ හා සමාන තනතුරු දරණ උසස් නිලධාරීන්ගේ ප්‍රයෝජනය සඳහා මෝටර් රථ 08 ක් හා ඩබල් කැබ් රථ 02ක් මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ මිලදී ගැනීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙතින් අංක BD/NS/103/03/03/31 හා 2017.03.02 දිනැති ලිපිය මඟින් අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ඉදිරි ක්‍රියාමාර්ග ගෙන ඇත. එහිදී මෝටර් රථ |

<table>
<tr>
<td></td>
<td></td>
<td>ගැනීමකින් තොරව සිදුකර තිබුණි. මේ සඳහා ලංසු කරුවන් නොපැමිණි බැවින් ත්‍රිවිධ හමුදාවේ මෙවැනි ලංසු සඳහා ඉල්ලුම් කරන ලද ඉල්ලුම්කරුවන් සඳහා මිල ගණන් කැඳවා ප්‍රතිචාර දැක්වූ එකම හා අවම මිල සඳහන් කරන ලද සැපයුම්කරු තෝරාගත් බව ප්‍ර.ග.නි. ප්‍රකාශ කලේය.</td>
<td>සඳහා උපරිම මාසික කුලිය රු.135,000.00 ක් ද ඩබල් කැබ් රථ සඳහා උපරිම මාසික කුලිය රු.165,000.00ක් ද වශයෙන් අනුමැතිය ලබා දී තිබුණි.<br><br>3.2 කෙසේ වෙතත් ඉහත මිල ගණන් යටතේ අතිරේක ලේකම් හෝ ඒ හා සමාන තනතුරු සඳහා ලබා දීමට සුදුසු වාහන මොඩලයන් නොමැති බවට වාර්තා වී ඇති හෙයින් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙතින් අංක BD/NS/103/03/03/31 හා 2017.05.25 දිනැති ලිපිය මඟින් අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ජාතික අයවැය චක්‍රලේඛ අංක: 01/2016 (i) හා 2016.09.19 දිනැති සංශෝධිත චක්‍රලේඛයේ සඳහන් සංශෝධිත උපරිම මාසික බදු කුලියට යටත්ව එම වාහන මිලදී ගැනීමට කටයුතු කර ඇත. එම මිල සීමාවන් පහතින් දක්වා ඇත.<br><br>
<table>
<tr><th>නිලධාරි කාණ්ඩය/ වාහන වර්ගය</th><th>සංශෝධිත උපරිම මාසික බදු කුලිය<br>(වැට බදු රහිත) රු.</th></tr>
<tr><td>අතිරේක ලේකම් /අධ්‍යක්ෂ ලේකම්වරු / මණ්ඩලවල සභාපතිවරු මට්ටමේ නිලධාරීන් ජනරාල්වරු/ දිස්ත්‍රික් හෝ සමාන</td><td>200,000.00</td></tr>
<tr><td>ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරු/අධ්‍යක්ෂවරු හෝ සමාන මට්ටමේ නිලධාරීන්</td><td>135,000.00</td></tr>
<tr><td>සංචිත වාහන සඳහා ඩබල් කැබ්</td><td>165,000.00</td></tr>
</table>
</td>
</tr>
</table>

| | | | |
|---|---|---|---|
| | | | 3.3 මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ මෙම වාහන ලබා ගැනීම සඳහා ජාතික තරඟකාරි ලංසු ක්‍රමය යටතේ ලංසු කැඳවීමට 2017.08.18 දින පැවති අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු රැස්වීමේ දී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව 2017.08.27 දින පුවත් පත් දැන්වීම් **(ඇමුණුම - 08)** පළකර ලංසු කැඳවීමට කටයුතු කර ඇත. ලංසු විවෘත කිරීම 2017.09.19 දිනට යෙදී තිබූ අතර, මිල ගණන් විවෘත කරන අවස්ථාවේ දී කිසිදු ලංසුවක් ඉදිරිපත් වී නොතිබීම හේතුවෙන් ලංසු කොන්දේසි ලිහිල් කර නැවත සීමිත ජාතික තරඟකාරි ලංසු ක්‍රමය යටතේ ලංසු කැඳවීමට 2017.12.15 දින පැවති අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු රැස්වීමේ දී අනුමැතිය ලබාගෙන ඉදිරි පියවර ගෙන ඇත. එම අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තාව. **(ඇමුණුම - 09)** ලෙස මේ සමග ඉදිරිපත් කර ඇත.<br><br>3.4 ඒ අනුව සීමිත ජාතික තරඟකාරී ලංසු ක්‍රමය යටතේ ලංසු කැඳවීම සඳහා අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබා දී ඇති අතර, අනතුරුව එම කාල වකවානුව තුල මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ වාහන මිල දී ගෙන තිබූ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත ලංසු ඉදිරිපත් කල සැපයුම්කරුවන්ගේ නාම ලේඛණ ලබා ගැනීමට අධ්‍යක්ෂ ජනරාල් (ගිණුම් හා මූල්‍ය) අංක MOD/FD/PB/27/II/2017 හා 2018.01.08 දිනැති ලිපිය මඟින් ඉල්ලීම් කර ඇත. **(ඇමුණුම - 10)**<br><br>3.5 ගණකාධිකාරී අංක MF/6/16General/1/2018 හා 2018.01.11 දිනැති ලිපිය අනුව පහත සඳහන් ආයතන මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත වාහන මිලදී ගැනීමට ලංසු කැඳවීමේ දී ප්‍රතිචාර දක්වා ඇත. **(ඇමුණුම - 11)** |

| | | | |
|---|---|---|---|
| | | | අ. M/S V.S Rent A Car Service<br><br>ආ.M/S Central Finance Company PLC<br><br>ඇ.M/S Rajagiriya Tours and Transport (Pvt) Ltd<br><br>3.6 ඉහත ආයතන 03 සඳහාම ලංසු සඳහා ප්‍රතිචාර දැක්වීමට ලංසු ආරාධනා (Invitation For Bids) ලිපි මඟින් යැවීමට කටයුතු කර ඇත. **(ඇමුණුම - 12)**<br><br>3.7 ඒ අනුව 2018.04.09 දින මිල ගණන් විවෘත කරන අවස්ථාවේ දී M/s Central Finance Company PLC පමණක් ලංසු ඉදිරිපත් කර තිබුණි.<br><br>3.8 M/s Central Finance Company PLC ඉදිරිපත් කර තිබූ ලංසු ඇගයීම කිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කර ඇති අතර, ඉදිරිපත් කර තිබූ කරුණු සැලකිල්ලට ගෙන තාක්ෂණික ඇගයීම් සිදුකර කමිටු වාර්තාව 2018.04.11 දින ඉදිරිපත් කර ඇත.<br><br>3.9. M/s Central Finance Company PLC විසින් අතිරේක ලේකම්වරුන් සඳහා මෝටර් රථ 05ක් සැපයීම සඳහා පහත සඳහන් පරිදි වරණයන් (Option) 03ක් ඉදිරිපත් කර ඇත. |

| වරණය | විස්තරය | මාසික බදු කුලිය (වැට් බදු රහිත) රු. |
|---|---|---|
| I | Reconditioned Honda Vezel RS2017 model | Rs. 151,963.00 |
| II | Reconditioned Toyota Premio 2018 model | Rs. 180,713.00 |
| III | Brand new Honda Civic 2017 Model | Rs. 190,760.00 |

3.10 M/s Central Finance Company PLC ඉදිරිපත් කර තිබූ වරණයන් (Options) අතුරින් රු.151,963.00 කට මිල ඉදිරිපත් කර ඇති Honda Vazel SUV 2017 මොඩලය Sedan Type නොවුන බැවින් හා එම මාදිලියේ වාහන වර්ගය අතිරේක ලේකම්වරුන්ගේ භාවිතය සඳහා උචිත නොවන බැවින් දෙවන වරණය ලෙස ඉදිරිපත් කර තිබූ රු.180,713.00 ක් වූ Toyota Premio 2018 මොඩලය නිලධාරීන් සඳහා සුදුසු Sedan type මෝටර් රථ වන බැවින් එම වර්ගයේ මෝටර් රථ 05ක් මිල දී ගැනීම සුදුසු බවට තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර ඇත. මෙහිදී වාහන මාදිලියේ උචිත ස්වරූපය හා නිෂ්පාදන වර්ෂයෙහි උචිත ස්වරූපය හා නිෂ්පාදන වර්ෂයෙහි නවීනත්වය සැලකිල්ලට ගෙන අදාල නිර්දේශ ලබා දී ඇත.

3.11. M/s Central Finance Company PLC විසින් ජොෂ්ඨ සහකාර ලේකම්වරුන් සඳහා මෝටර් රථ 03ක් සැපයීම සඳහා Reconditioned Toyota Axio WXB 2017 Model රථයක් Rs.134,950.00 සඳහන් පරිදි ඉදිරිපත් කර ඇති වරණය (Option) තාක්ෂණික ඇගයීම් කමිටුව විසින්

නිර්දේශ කර ඇත.

3.12 එමෙන්ම M/s Central Finance Company PLC විසින් ඩබල් කැබ් රථ සඳහා පහත සඳහන් පරිදි වරණයන් (Option) 02ක් ඉදිරිපත් කර ඇත.

| වරණය | විස්තරය | මාසික බදු කුලිය (වැට් බදු රහිත) රු. |
|---|---|---|
| I | Brand New Toyota Hilux 2018 Model | Rs. 164,967.00 |
| II | Brand New Isuzu D Max 2017/2018 Model | Rs. 163,542.00 |

3.13. කැබ් රථ සඳහා ඉදිරිපත් කර ඇති පළමු වරණය (Option i) Brand New Toyota Hilux 2018 මොඩලයේ කැබ් රථයක් සඳහා වන අතර, එය රු. 164,967.00ක මිලකට මෙහෙයුම් කල් බදු ක්‍රමය යටතේ ලබා ගැනීම සුදුසු බව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර ඇත.

3.14 අවම මිල යටතේ දෙවන වරණය (Option ii) සඳහා - Brand New Isuzu D Max 2017/2018 Model රු.163,542.00 මිලකට ඉදිරිපත් කර තිබී ඇත.

3.15 එහෙත් සංසන්දනාත්මකව රු. 1425.00ක ඉහළ මිලක් පැවති

| | | | |
|---|---|---|---|
| | | | Brand New Toyota Hilux 2018 මාදිලිය රු.164,967.00 ක මුදලකට ගැනීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් Toyota වර්ගයේ රථ පොදුවේ ගත් කල රට තුල පවත්නා ජනප්‍රිය භාවය හා රජයේ ආයතන බොහෝමයක් පැමිණිලි වලින් තොරව භාවිතා කරනු ලබන රථයක් වන නිසාත්, M/s Central Finance Company PLC විසින් ඉදිරිපත් කර ඇති Brand New Isuzu D Max 2017/2018 වඩා ප්‍රචලිත නොවූ මාදිලියලක් නිසාද Brand New Toyota Hilux 2018 මාදිලිය නිෂ්පාදනයෙන් ඉදිරි වර්ෂයන් වූ නිසාත් එකී කරුණු සැලකිල්ලට ගෙන නිර්දේශ ඉදිරිපත් කර තිබුණි.<br><br>3.16 ඉහත කරුණු මත අවම මිල පදනම් කර නොගෙන එක් කැබ් රථයක් මාසිකව රු.164,967.00 ක (වැට් බදු රහිත) මුදලකට කැබ් රථ 02ක් මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ ලබා ගැනීම සුදුසු බව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර ඇත.<br><br>3.17 මෙම කරුණු සැලකිල්ලට ගත් 2018.05.10 දින රැස් වූ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් Brand New Toyota Hilux 2018 මාදිලියේ කැබ් රථයක් රු.164,967.00 ක (වැට් බදු රහිත) මුදලකට කැබ් රථ 02ක් වසර 05 ක් කාලයකට මෙහෙයුම් කල් බදු ක්‍රමය යටතේ ලබා ගැනීම සඳහා අනුමැතිය ලබාදී ඇත.<br><br>3.18 2018.05.10 දින රැස් වූ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් මෝටර් රථ 08 මෙහෙයුම් කල් බදු ක්‍රමය යටතේ ලබා ගැනීම සඳහා M/s Central Finance Company PLC වෙතින් වාහනයේ තත්වය පිළිබඳව (either be brand new or unregistered vehicles with a mileage less than 1,000 km at the station of hiring) පැහැදිලි කිරීම (Clarification) |

| | | | |
|---|---|---|---|
| | | | ලබා ගැනීම සඳහාත් අනුමැතිය ලබා දී ඇත.<br><br>3.19 ඒ අනුව M/s Central Finance Company PLC වෙතින් පැහැදිලි කිරීම (Clarification) ලබා දී ඇති අතර, මෙම මෝටර් රථ Brand new or unregistered vehicles with a mileage less than 1,000km at the point of hiring බවට වාර්තා කර ඇත.<br><br>3.20 මෙම පැහැදිලි කිරීම (Clarification) තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කර ඇති අතර, තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ මත 2018.06.21 දින රැස් වූ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් Recondition Toyota Premio 2018 මොඩලයේ මෝටර් රථ 05 ක් ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරුන් සඳහා ද Reconditioned Toyota Axio WXB 2017 Model මෝටර් රථ 03ක් ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරුන් සඳහා ද වසර 05 ක් සඳහා මෙහෙයුම් කල් බදු ක්‍රමය යටතේ ලබා ගැනීම සඳහා අනුමැතිය ලබා දී ඇත.<br><br>මේ වන විට අවසන් භාවිතා කරන්නන්ගේ අවශ්‍යතාවය මත ඉදිරි ප්‍රසම්පාදන ක්‍රියාවලි ආරම්භ කිරීමේදී ඒ සඳහා ගතවන කාලය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කිරීමට, අදාළ දැනුමැති පුද්ගලයන් තාක්ෂණික ඇගයීම් කමිටු සඳහා පත්කර ගැනීමට, නිවැරදිව ලංසු ලේඛන සකස්කර ගැනීමට, තත්ත්ව පරීක්ෂණ වාර්තා ලබා ගැනීම කඩිනම් කිරීමට මෙන්ම ප්‍රසම්පාදන කමිටු වෙත ඉදිරිපත් කිරීම කාර්යක්ෂම කිරීමටද උපදෙස් ලබා දී ඇත. |

| | | | |
|---|---|---|---|
| | | (ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.1 (අ) වගන්තියේ විධිවිධාන වලට පටහැනිව, ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට පොලියෙස්ටර් වුල් රෙදි මීටර් 529, 000 ක් මිලදී ගැනීමට ලංසු කැඳවීමේ ලේඛනවල සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත්කල ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අනුව, රෙදි සාම්පල වල ගුණාත්මකභාවය පිළිගත් ආයතන 03 කින් ලබා ගන්නා රසායනාගාර තත්ත්ව පරීක්ෂණ වාර්තාවන් මත පදනම්ව ලංසු ඇගයීම සිදු කරනු ලබන බව සඳහන් කර තිබුණද, ලංසු විවෘත කිරීමෙන් අනතුරුව එලැඹි ප්‍රසම්පාදන කමිටු තීරණයක් අනුව එක් ආයතනකින් පමණක් ලබාගත් තත්ත්ව පරීක්ෂණ වාර්තාවක් පදනම් කරගෙන ලංසු ඇගයීම සිදුකර තිබුණ බව අනාවරණය විය. තත්ත්ව පරීක්ෂණ වාර්තා ලබා දීමට රසායනාගාර 03 විසින් විශාල කාලයක් පැවතීම මත එක් ආයතනයකින් පමණක් තත්ත්ව පරීක්ෂණ වාර්තා ලබාගත් බව ප්‍ර.ග.නි ප්‍රකාශ කලේය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.1 (අනුව ලංසු ඇගයීම, ලංසු කැඳවීමේ ලේඛන වල සඳහන් කර ඇති ක්‍රමය, නියමයන් හා කොන්දේසි වලට අනුකූලව සිදුකල යුතු වුවත්, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සඳහා පොලියෙස්ටර් වුල් රෙදි මීටර් 529, 000 ක් මිලදී ගැනීමට අදාළ ලංසු කැඳවීමේ ලේඛනයේ සහ 2021.07.29 වන දිනැති අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අනුව, රෙදි සාම්පල් වල ගුණත්වය පිළිබඳව රෙදි පිළි හා ඇගළුම් තාක්ෂණය පිළිබඳව පිළිගත් ආයතන 3කින් ලබා ගන්නා රසායනාගාර තත්ව පරීක්ෂණ වාර්තාවන් මත පදනම්ව ලංසු ඇගයීම සිදු කර බව සඳහන් වුවත් පහත හේතූන් මත පිළිගත් එක් ආයතනයකින් සහ ක්ෂේත්‍ර පරීක්ෂාව තුලින් ලබාගත් වාර්තා සැලකිල්ලට ගනිමින් මෙම ප්‍රසම්පාදනය ඉදිරියට කර ගෙන යාමට 2021.08.11 වන දින පැවති අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් උපදෙස් ලබා දෙන ලදි.<br><br>අ. නිලධාරීන් රාජකාරි කටයුතු සඳහා දෛනිකව පරිහරණය කරන නිල ඇඳුම් මැසීමට මෙම රෙදි වර්ගය යොදා ගැනීම.<br><br>ආ. කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ආයතනයක් පවත්වා ගෙන යාමට අවශ්‍යම පිරිස පමණක් කැඳවීමට රජයෙන් ලද උපදෙස් මත රසායනාගාර පරීක්ෂණ ආයතනයන්හි ද සුළු පිරිසක් රජකාරි සඳහා ගෙන්වීම හේතුවෙන් පරීක්ෂණ වාර්තා ලබා ගැනීමට විශාල කාලයක් ගත වීම.<br><br>ඇ. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි අතිරේක 4.2.3 ට අනුව ජාත්‍යාන්තර තරඟකාරී ලංසු ක්‍රමය යටතේ ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට සති 06 ක (උපරිමය සති 13 කට යටත්ව) කාලයක් ලබා දී ඇත. එයින් සති 03 ක කාලයකින් ලංසු ඇගයීම සිදු කිරීමටත් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව නිර්දේශ කර තිබීම. |

ඇ. අතීත අත්දැකීම් මත ආයතන 03 කින් රසායනාගාර පරීක්ෂණ කටයුතු සිදු කිරීමට විශාල කාලයක් ගත වීම.

උදාහරණයක් ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත රට වෙරළු පැහැති නාන තුවා 278,250 ක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයේ නියැදීන්හි තත්ත්ව පරීක්ෂණයක් සඳහා ගත වූ කාලයන් පහත පරිදි වේ.

| ආයතනය | නියදීන් භාරදුන් ලිපිය | වාර්තා ලද දිනය | ගත වූ දින ගණන |
|---|---|---|---|
| ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟළුම් ආයතනය | 2021.05.06 | 2021.07.14 | දින 69 |
| ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය | 2021.05.06 | 2021.08.13 | දින 99 |
| මොරටුව විශ්ව විද්‍යාලය | 2021.06.14 | 2001.10.08 | දින 116 |

පිළිගත් ආයතන 03 කින් ලබා ගන්නා තත්ත්ව පරීක්ෂණ වාර්තා පදනම් කරගෙන ඉදිරියට යාමෙන් ප්‍රසම්පාදන අස්ථිත්වය ඉදිරිපත් කරන ලද පිරිවිතරයට සමාන නිල ඇඳුම් රෙදි ලබාගත හැකි බව සත්‍යයයි. රෙදිපිළි සඳහා වූ තත්ත්ව පරීක්ෂණයන් රාජ්‍ය ආයතනයන් වන ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟළුම් ආයතනය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සහ මොරටුව විශ්ව විද්‍යාලය තුලින් පමණක් සිදු කරන අතර, මෙම ආයතන තුනෙන්ම තත්ත්ව පරීක්ෂණ වාර්තා ලබා ගැනීමට කටයුතු කිරිම තුලින් ඒ ඒ ආයතන වෙතින් එකම කාලයක් තුල වාර්තා ලබා ගැනීමට නොහැකි වීම නිසා ප්‍රමාදයක් සිදුවේ. ඒ හේතුවෙන් අදාළ කාල රාමුව තුල ප්‍රසම්පාදන කටයුතු සිදුකර ගැනීමට නොහැකි වීමේ අවදානමක් දක්නට ලැබුණි.

| | | | |
|---|---|---|---|
| | | | එබැවින් පිළිගත් එක් ආයතනයකින් සහ ක්ෂේත්‍ර පරීක්ෂාව තුලින් ලබාගත් වාර්තා සැලකිල්ලට ගනිමින් මෙම ප්‍රසම්පාදනය ඉදිරියට කරගෙන යාමට 2021.08.11 වන දින පැවති අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් උපදෙස් ලබා දෙන ලදි. ඒ අනුව, ශ්‍රී ලංකා රෙජිකර්ම සහ ඇගළුම් ආයතනය තුලින් ලබා ගන්නා ලද තත්ත්ව පරීක්ෂණ වාර්තා පදනම් කරගෙන ඉදිරි කටයුතු සිදු කරන ලදි. නමුත් පරීක්ෂණ වාර්තා පරීක්ෂාවට ලක් කිරීමේදී ප්‍රධාන පරාමිතියක් වන Dimensional Stability to Dry Cleaning පරාමිතිය පරීක්ෂාවට ලක් නොකරන බව සඳහන් විණි. නිලධාරීන් රාජකාරි කටයුතු සඳහා දෛනිකව පරිහරණය කරන නිල ඇඳුම් මැසීමට යොදා ගන්නා මෙම රෙදි වර්ගයේ පවතින අත්‍යාවශ්‍ය බව සලකමින් මෙම පරාමිතිය සම්බන්ධයෙන් වන ක්ෂේත්‍ර පරීක්ෂාව තුලින් ලබාගත් වාර්තාවෙහි සඳහන් පරීක්ෂණ නිගමනය විද්‍යානුකූල පදනමක් මත වූ නිගමනයක් නොවුවද, එය සැලකිල්ලට ගනිමින් මෙම ප්‍රසම්පාදනය ඉදිරියට කරගෙන යන ලදි.<br><br>යුද්ධ හමුදාව විසින් සිදු කරනු ලබන ක්ෂේත්‍ර පරීක්ෂාව පිළිබඳව ලංසු ලේඛනයේ ඇගයීම් නිර්ණායක යටතේ සඳහන් කරන අතර, එය පරීක්ෂණාගාරයක සිදු නොකළ ද, නිසි විද්‍යානුකූල පදනමක් මත නියමිත නිර්ණායක ඇගයීම සඳහා යොදා ගනු ලබයි. එහිදී පර්යේෂණාගාර වල සිදු කළ වාර්තා සහ මෙම ක්ෂෙත්‍ර පරීක්ෂණ වාර්තා සියල්ලම එක් කොට නිසි ක්‍රම වේදයකට තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඔවුන්ගේ නිර්දේශ ලබා දී ඇති බැවින් විද්‍යානුකූල පදනමක් මත අනුමත කර ඇති බව වැඩි දුරටත් දන්වමි.<br><br>මේ වන විට අවසන් භාවිතා කරන්නන්ගේ අවශ්‍යතාවය මත ඉදිරි ප්‍රසම්පාදන ක්‍රියාවලි ආරම්භ කිරීමේදී ඒ සඳහා ගතවන කාලය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කිරීමට, අදාළ දැනුමැති පුද්ගලයින් තාක්ෂණික |

| | | | |
|---|---|---|---|
| | | | ඇගයීම් කමිටු සඳහා පත්කර ගැනීමට, නිවැරදිව ලංසු ලේඛන සකස් කර ගැනීමට, තත්ත්ව පරීක්ෂණ වාර්තා ලබා ගැනීම කඩිනම් කිරීමට මෙන්ම ප්‍රසම්පාදන කමිටු වෙත ඉදිරිපත් කිරීම කාර්යක්ෂම කිරීමට ද මේ වන විට උපදෙස් ලබාදී ඇත.<br><br>කෙසේ වුවද, 2025.05.27 දිනැති අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් මෙම ප්‍රසම්පාදනය අවලංගු කිරීමට අනුමැතිය ලබාදෙන ලද අතර, වඩාත් තරඟකාරී මිලක් ලබා ගැනීම සහ මහජන අරමුදල් කාර්යක්ෂමව භාවිතා කිරීම සහතික කිරීම සඳහා, 2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයේ බලයලත් මූල්‍ය සීමාවන්ට අනුව අදාළ ප්‍රසම්පාදන කමිටුව යටතේ වර්තමාන සත්‍ය අවශ්‍යතාවය පිළිබඳ මුළු පිරිවැය ඇස්තමේන්තුව සලකා බලා නව ප්‍රසම්පාදන ක්‍රියාවලියක් ආරම්භ කිරීමටද නියෝග කරන ලදී. |
| 09 | <u>**පාරිබෝගික ද්‍රව්‍ය ගබඩාවේ රු.මිලියන 12 අධික ද්‍රව්‍ය සම්බන්ධ ඌනතාවය.**</u> | 2021 ඔක්තෝබර් මාසයට අදාළ පාරිභෝගික ද්‍රව්‍ය අභියාචනා පත්‍ර ගොනුව අස්ථානගත වීම, පිරිවැය රු.මිලියන 6 කට අදාළව කිසිදු තොග ලේඛණයක් පවත්වාගෙන ගොස් නොතිබීම, ගබඩා භාරකරුවන්ගේ කාර්යයන් අධීක්ෂණය නොකිරීම හා ගිණුම් පොත්වල හරි වැරදි නොබැලීම පිළිබඳව කාරක සභාවේ අවධානයට ලක් විය.<br>මීට අදාළ ගබඩා භාරකරු හා අධීක්ෂණ නිලධාරිවරයා රාජකාරී වලින් ඉවත් කළ බවද නව කණ්ඩායමක් මේ සඳහා පත්කර තොග ගණනය කර පවත්වා ගෙන යන බවද ගබඩා භාරකරු හා අධීක්ෂණය නිලධාරීවරයා සඳහා මූලික පරීක්ෂණ සිදුකර විනය ක්‍රියාමාර්ග ගැනීමට රාජ්‍ය | අමාත්‍යාංශ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය ගබඩාවේ 2021 වර්ෂයේ සිදුවූ භාණ්ඩ ඌණතාවය සම්බන්ධයෙන් පරීක්ෂණ මණ්ඩල වාර්තාව, මු.රෙ. 104 (3) සහ මු.රෙ 104 (4) අවසන් වාර්තාව අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ ලබා ගැනීමෙන් අනතුරුව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී.<br><br>පරීක්ෂණ මණ්ඩල නිර්දේශ ප්‍රකාරව පවරා ඇති රාජකාරි ඉටු නොකිරීම හා අධීක්ෂණ දුර්වලතා යන කරුණු මත පදනම්ව එම සිද්ධිය සම්බන්ධව පහත නිලධාරීන්ට එරෙහිව මූලික විමර්ශණයක් සිදුකර විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා එහි නිර්දේශ ප්‍රකාරව කටයුතු කරන ලෙස අතිරේක ලේකම් (පරිපාලන) වෙත දන්වන ලදී.<br><br>අ. කේ.ඩී.පී. පුෂ්පකුමාර - සංවර්ධන නිලධාරි<br>ආ. මංජුල කළුආරච්චි - ගණකාධිකාරි<br>ඇ. ජේ.එස්.කේ. සමරතුංග - ප්‍රධාන ගණකාධිකාරි<br>ඈ. අයි.ජී.එස්.එස්. සිරිමාන්න - ප්‍රධාන මූල්‍ය නිලධාරි |

| | | | |
|---|---|---|---|
| | | පරිපාලන, ස්වදේශීය කටයතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය වෙත යවා ඇති බවද ප්‍ර.ග.නි ප්‍රකාශ කලේය. තවද, විනයානුකූල කටයුතු කරන තෙක් ගබඩා භාරකරු වෙතින් මාසිකව රු.9,207.00 ක මුදලක් වැටුපෙන් අයකර ගන්නා අතර, තවත්, රු.12.173,527 ක මුදලක් අයකර ගැනීමට තිබෙන බවද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවටද මේ සම්බන්ධව පැමිණිලි කර ඇති බවද හෙතෙම ප්‍රකාශ කලේය.<br><br>කෙසේ වුවද, අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මඟින් මෙම තොරතුරු අනාවරණය කර නොගැනීම දූර්වලතාවයක් බව කාරක සභාව පෙන්වා දුන්නේය. | ඒ අනුව ඊට අදාළ මූලික විමර්ශන කමිටුවක් පත්කර ඇති අතර, පුනරාවර්තන ගබඩාවට අදාළ සියළු ලිපි ගොණු සහ ලේඛණ විමර්ශන කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී. ඒ අනුව විමර්ශන කමිටු නිර්දේශ ප්‍රකාරව ඊට අදාළ පුද්ගලයින් වෙතින් අයකර ගැනීම් සිදු කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව කාරුණිකව දන්වමි.<br><br>තවද, මේ සම්බන්ධයෙන් ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් 2015.08.05, 2019.02.25 හා 2020.09.22 යන දිනයන්හිදී ගබඩා පරීක්ෂණ සිදුකර ඒ පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ අදාළ අංශ භාර නිලධාරීන් වෙත දැනුම් දී ඇති බව අංක MOD/IAD/07/01/04/27 දරන 2026.05.08 දිනැති ලිපිය මඟින් දන්වා ඇත. **(ඇමුණුම - 13)** |
| 10 | <u>කාර්යය මණ්ඩල තොරතුරු</u> | ආරක්ෂක අමාත්‍යාංශය හා ඒ යටතේ වන අනෙකුත් අංශ වල රාජකාරී සඳහා අමාත්‍යාංශයේ අනුමත කාර්යය මණ්ඩලයට අතිරේකව ත්‍රිවිධ හමුදා නිලධාරීන් හා සෙසු නිලයන්ට අයත් හමුදා සාමාජිකයන් 700 ඉක්ම වූ සංඛ්‍යාවක් සේවා නියුක්ත කර තිබූ අතර, ඒ සඳහා වන පාරිශ්‍රමිකය අදාළ ත්‍රිවිධ හමුදා විසින් දරා තිබුණි. තවද, සිවිල් අංශයන් විසින් සපුරාලිය යුතු පුරප්පාඩු 122 ක් ආවරණය කර ඇත්තේ ත්‍රිවිධ හමුදාවේ සෙසු නිලයන් පමණි. | ආරක්ෂක අමාත්‍යාංශයීය අනුමත කාර්යය මණ්ඩලයට අතිරේකව ත්‍රිවිධ හමුදා කාර්යය මණ්ඩලය ද ඇතුලත් කර කාර්යය මණ්ඩල යෝජනාවලියක් මේ වන විට සකස් කරමින් පවතින අතර, එම යෝජනාවලිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතය. |
| 11 | <u>“අපි වෙනුවෙන් අපි අරමුදල”</u> | යුද්ධ හමුදාවේ අනතුරු වලට ලක් වූ හා මිය ගිය රණ විරුවන් සඳහා නිවාස සෑදීමට හා රණවිරු දරුවන් සඳහා ශිෂ්‍යත්ව ලබා දීමට | අපි වෙනුවෙන් අපි අරමුදලේ ආදායම් මාර්ගයක් ලෙස ත්‍රිවිධ හමුදා කඳවුරු භූමි තුල ස්ථාපිත සන්නිවේදන කුළුණු මඟින් ලැබෙන ආදායම 100% ක් ඒකාබද්ධ අරමුදලට බැර කල යුතු බව රාජ්‍ය මුදල් |

| | | | |
|---|---|---|---|
| | | මෙම අරමුදල් භාවිතා කරන බවද ප්‍ර.ග.නි ප්‍රකාශ කලේය. සන්නිවේදන කුළුණු ආදායම හා නිවාස සංකීර්ණ යෝජනා ක්‍රම වලින් ලැබෙන ආදායම් “අපි වෙනුවෙන් අපි අරමුදල” වෙත බැරවෙන බව ආරක්ෂක අරමුදල සඳහා ගෙවල් කුලී ආදායම් ලැබෙන බවද මෙහිදී අනාවරණය විය. | දෙපාර්තමේන්තුවේ අංක PED/RED/REG/F&C/2025/DEF හා 2025.03.05 වන දිනැති ලිපිය මඟින් දැනුම් දී ඇත. ඒ අනුව, 2026 පෙබරවාරි මස 11 වන දිනැති 36 වන කළමනාකරණ මණ්ඩලය මඟින් කුළුණු ආදායම ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සඳහා කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලැබී ඇත. කෙසේ වුවද, ජනාධිපති ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් 2026.04.18 දින පැවති ජාතික ආරක්ෂක අරමුදලේ පාලක මණ්ඩල රැස්වීමේදී සන්නිවේදන කුළුණු ආදායම ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සම්බන්ධයෙන් ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම් (සංවර්ධන පරිපාලන) ගේ ප්‍රධානත්වයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව හා අයවැය දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡාවක් සිදු කරන ලෙස දෙන ලද උපදෙස් පරිදි ඇමුණුම **- 14** ලිපිය ජනාධිපති ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත. |
| 12 | <u>ආපදා කළමනාකරණය</u> | ආපදා පුරෝකථන වැඩ පිළිවෙල පිළිබඳව කාරක සභාව විමසීය.<br><br>අදාළ අනෙකුත් ආයතන සම්බන්ධීකරණයෙන් දිවයිනේ දිස්ත්‍රික්ක 25 වෙනුවෙන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන 25 ක් භාෂාත්‍රයෙන්ම පැය 24 මුළුල්ලේම ක්‍රියාත්මක වන බවද ජාතික ආපදාවකදී ත්‍රිවිධ හමුදාව හා පොලීසිය ප්‍රථම ප්‍රතිචාර දක්වන්නන් ලෙස කටයුතු කරන බවද ප්‍ර.ග.නි. ප්‍රකාශ කලේය. සුනාමි ආපදා පිළිබඳව ජංගම දුරකථන වෙත පණිවුඩ ලබාදීම අරමුණ කරගෙන දුරකථන ද්වාරයක් (Telephone Portal) 2023.12.26 දින විවෘත කිරීමට සැලසුම් කර ඇති බවත්, ඒ සඳහා අදාළ දිස්ත්‍රික්ක 14 ක් සඳහා සේවා සපයන්නන් දැනටමත් අනුයුක්ත කොට | මෙම නිරීක්ෂණය සම්බන්ධයෙන් වන කරුණු දැක්වීම් හා පැහැදිලි කිරීම් පහත පරිද ඉදිරිපත් කරමි.<br><br>01. <u>දිවයිනේ දිස්ත්‍රික්ක **25** වෙනුවෙන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන **25 ක්** භාෂා ත්‍රිත්වයෙන්ම පැය **24** මුළුල්ලේම ක්‍රියාත්මක වීම</u><br><br>දිවයිනේ දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන පරිදි සතියේ දින 7 ම පැය 24 පුරාවම **ක්‍රියාත්මක** දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකයන් පිහිටුවා ඇති අතර, භාෂා ත්‍රිත්වයෙන්ම ඇතැම් දිස්ත්‍රික්ක වල සතියේ දවස් 7 ම පැය 24 පුරාම ක්‍රියාත්මක කිරීමට නිලධාරීන් නොමැති වීම මත මේ වනවිට නිලධාරීන් බඳවා ගනිමින් සිටියි.<br><br>**02**<u>. ජාතික ආපදා අවස්ථාවකදී ත්‍රිවිධ හමුදාව හා පොලීසිය ප්‍රථම ප්‍රතිචාර දක්වන්නන් ලෙස කටයුතු කිරීම.</u><br>ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ (DMC) සම්බන්ධීකරණය සහ දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ මඟ පෙන්වීම මත, ජාතික ආපදා අවස්ථාවකදී |

| | | | |
|---|---|---|---|
| | | ඇති බවත්, ප්‍ර.ග.නි කාරක සභාව වෙත දැනුම් දුන්නේය. සුනාමි අනතුරු ඇඟයීමේ කුළුණු වල අදාළ චන්ද්‍රිකා තාක්ෂණය මේ වන විට අක්‍රියව පවතින බවද දුරකථන හරහා ආපදා අනතුරු ඇඟවීමේ ක්‍රියාවලියක් ඒ වෙනුවට හඳුන්වා දීමට බලාපොරොත්තු වන බවද හෙතම ප්‍රකාශ කලේය. උස් ගොඩනැගිලි වල සිදුවිය හැකි ගිනි ආපදා වලිදී එම ගිනි නිවීම සඳහා අවශ්‍ය කෙරෙන උපකරණ වල හිඟයක් පවතින බවද මෙහිදී අනාවරණය විය.<br><br>සී.බී.එස්.අයි. පෙරේරා<br>ප්‍රධාන ගණකාධිකාරී (ගිණුම් හා මූල්‍ය)<br>ආරක්ෂක අමාත්‍යාංශය<br>ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය<br>ශ්‍රී ජයවර්ධනපුර<br>කෝට්ටේ | ත්‍රිවිධ හමුදාව හා පොලිසිය ප්‍රථම ප්‍රතිචාර දක්වන්නන් ලෙස ක්‍රියා කරනු ලබයි.<br>**<u>03. සුනාමි ආපදා පිළිබඳව ජංගම දුරකථන වෙත පණිවුඩ ලබාදීම අරමුණු කරගෙන දුරකථන ද්වාරයක් 2023.12.26 විවෘත කිරීම.</u>**<br><br>සුනාමි ආපදා පිළිබඳව ජංගම දුරකථන වෙත පණිවුඩ ලබා දීම අරමුණු කර ගනිමින් සියළුම ජංගම මෙන්ම ස්ථාවර දුරකථන සේවා සපයන පාර්ශවකරුවන් හා ඒකාබද්ධව, අවබෝධතා ගිවිසුම් අත්සන් කොට, සුනාමි අවදානම පවතින දිස්ත්‍රික් 14 සඳහා ආපදා අවස්ථාවේදී පූර්ව අනතුරු ඇඟවීමේ පණිවිඩ නිකුත් කිරීමට අවැසි ක්‍රියාමාර්ගයක් සිදු කොට ඇත.<br><br>**<u>04. සුනාමි අනතුරු ඇඟවීමේ කුළුණුවල අදාල චන්ද්‍රිකා තාක්ෂණය මේ වන විට අක්‍රියව පැවතීම හා දුරකථන හරහා ආපදා අනතුරු ඇඟවීමේ ක්‍රියාවලියක් හඳුන්වා දීම.</u>**<br><br>CResMPA ව්‍යාපෘතිය හරහා බහු විධ ආපදා කුළුණු ස්ථාපිත කිරීමට යෝජිතව පැවතිය ද ඒ සඳහා වන අධික මුදල නොමැති වීම මත රාජ්‍ය ආයෝජන වැඩසටහන (PIP) හරහා මේ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමට ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කර ඇත. මීට අමතරව CDRI වැඩසටහන සඳහා ද යෝජනා ඉදිරිපත් කර ඇත.<br><br>05. <u>උස් ගොඩනැගිලි වල සිදුවිය හැකි ගිනි ආපදා වලදී එම ගිනි නිවීම සඳහා අවශ්‍ය කෙරෙන උපකරණවල හිඟතාවයක් පවතින අතර, ඒ පිළිබඳව ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුව වෙත ලිපි මඟින් දැනුම් දී ඇත.</u><br><br>ජනාකීර්ණ ප්‍රදේශ වල උස් ගොඩනැගිලි වල සිදුවිය හැකි ගිනි ආපදා අවම කිරීමට අවශ්‍ය sky ladder නොමැතිකම හා එය තට්ටු 22 කට පමණක් සීමාවීම තුල එමගින් උස් ගොඩනැගිල්ලක ගිනි පාලනය කිරීම සඳහා දැඩි ශ්‍රමයක් ගත යුතු බවද කාරුණිකව පෙන්වා දෙමි. |

# ආරක්ෂක අමාත්‍යාංශය
# பாதுகாப்பு அமைச்சு
# MINISTRY OF DEFENCE

ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, ශ්‍රී ලංකාව.
பாதுகாப்பு தலைமையக கட்டிடம், ஸ்ரீ ஜயவர்தனபுர, கோட்டே, இலங்கை.
Defence Headquarters Complex, Sri Jayawardenepura, Kotte, Sri Lanka. *Website* : *www.defence.lk*

මගේ අංකය / எனது இல / My No: MOD/DEF/HRM/GEN/OTHERS/ 88 ( 11) (197)

ඔබේ අංකය / உமது இல / Your No:

තැ. පෙ. / த. பெட்டி / P.O. Box: 572

දුරකථන / தொலைபேசி / Telephone: 2430860-9, 2430870-8

ලේකම් / செயலாளர் / Secretary: දුර./தொ./Tel. : 011 2381154; ෆැක්ස්/தொ./Fax.: 011 2541529; වි. තැපෑල/மி.அ./Email : secdefence@defence.lk


දිනය / திகதி / Date: 2023. 11 . 03

යුද්ධ හමුදාධිපති

නාවික හමුදාධිපති

ගුවන් හමුදාධිපති

**<u>ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවතින ත්‍රිවිධ හමුදාවන් හා වෙනත් ආයතන වෙතින් බාහිර පාර්ශව වෙත සපයන සේවාවන් වෙනුවෙන් උපයන ආදායම් සම්බන්ධව රජයේ ගිණුම්කාරක සභාවෙන් සහ ජාතික විගණන කාර්යාලයෙන් සිදු කරන ලද විමසීම් සම්බන්ධයෙන් ක්‍රමවේදයක් සකස් කිරීම</u>**

යොමුවන්:

(අ). බීඑෆ්/යූඑන්/171/1 (82) හා 2023.10.16 දිනැති යුද්ධ හමුදාධිපතිගේ ලිපිය

(ආ). එන්එච්කිව්/එස්වීසී/එම්එච්එස්/01/2022 හා 2023.10.11 දිනැති නාවික හමුදාධිපතිගේ ලිපිය

(ඇ). ශ්‍රීලංගුහ/2251/2/2/රනොඅ හා 2023.10.05 දිනැති ගුවන් හමුදාධිපතිගේ ලිපිය

(ඉ). MOD/DEF/HRM/GEN/OTHERS/88/11 හා 2023.09.21 දිනැති ලිපිය

